කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

**ක්‍රිස්තියානි සංස්කෘතිය** (පැරණි නිර්දේශය)

(අධ්‍යයන වර්ෂ 2012/13 සිට 2016 දක්වා)

**ක්‍රිස්තියානි ශාසනයේ ඉතිහාසය CHCU– E 2015**

එක් කොටසකින් ප්‍රශ්න දෙකක් (02) ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : පළමු කොටස -06
දෙවන කොටස -07

කාලය : පැය 03 යි.

---

පළමුවන කොටස - ලෝක සභා ඉතිහාසය

01. එඩ්වඩ් ගිබන් නමැති කිතුනු සභා ඉතිහාසය පිළිබඳ විශාරදයාගේ දැක්මට අනුව, රෝම අධිරාජ්‍යයේ හිංසන සමයේ මුල් කිතුනු සභාවේ වර්ධනයට බලපෑ ප්‍රධාන හේතු විචාරාත්මකව පැහැදිලි කරන්න.

02. අ) මුල් කිතුනු සභාවේ සාධාර්මික ධර්මයට බලපෑ දූර්මත පහක් (05) නම් කරන්න.

ආ) ඒරියස්වාදය **(Arianism)** හා නෙස්ටෝරියානුවාදය **(Nestorianism)** යන ක්‍රිස්තුවේදීය දූර්මත දෙක විස්තර කරන්න.

03. ගෝත්‍රික ජනයාගේ සංවර්තනයෙන් පසු යුරෝපය තුළ ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත වූ ආකාරය විමසන්න.

04. අ) මාටින් ලූතර්ගේ ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයට බලපෑ හේතු පහදන්න.

ආ) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයේ ව්‍යාප්තිය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. අ) දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ නිර්දේශ 16 නම්කරන්න.

ආ) ව්‍යවස්ථා (constitutions) සතර පිළිබඳ සවිස්තර සටහනක් ලියන්න.

06. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ සවිස්තර සටහන් ලියන්න.

අ) කිතුනු තාපස ප්‍රගමනය

ආ) ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවෙන් ප්‍රකාශිත මූලික තීරණ

ඇ) පළමු වතිකාන මන්ත්‍රණ සභාවෙන් ප්‍රකාශිත ධර්මසිද්ධාන්ත ව්‍යවස්ථාව **(Dogmatic Constitution- *Pastor Aeternus*)**

## දෙවන කොටස - ලංකා සභා ඉතිහාසය

07. පූර්ව පෘතුගීසි යුගයේ කිතුනු ආගම ලංකාවේ පැවතියේ ද යන්න විචාරාත්මකව විග්‍රහ කරන්න.

08. පෘතුගීසි යුගයේ කෝට්ටේ රාජ්‍ය මුල් කර ගත් කතෝලික ධර්මදූත ප්‍රගමනය පැහැදිලි කරන්න.

09. ජුසේ වාස් පියතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති වත්මන් කිතුනු සභාවන්ට වැදගත් වන්නේදැයි විචාරයට ලක්කරන්න.

10. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාගේ හෙළ කිතුනු ලේඛන පිළිබඳ ඇගයීමක් කරන්න.

11. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ආරම්භ වූ ලංකා සභාවේ වර්ධනය විස්තර කරන්න.

12. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳව සවිස්තර සටහන් ලියන්න.

   අ) පෘතුගීසි යුගයේ මහනුවර හෝ යාපනය යන රාජ්‍යයන් මුල් කර ගත් කතෝලික ධර්මදූත ප්‍රගමනය

   ආ) බැප්ටිස්ට් සභාව හෝ මෙතෝදිස්ත සභාවේ ලාංකේය ඉතිහාසය

   ඇ) බ්‍රිතාන්‍ය යුගයේ කිතුනු අධ්‍යාපනය

   ඈ) නිදහසින් පසු ලාංකේය ක්‍රිස්තියානි සභාවන්ගේ මූලික ප්‍රවණතා

13. ලාංකේය පාස්කු දුඃඛප්‍රාප්ත නාට්‍යයේ ඉතිහාසය යටත්විජිත සමයේ සිට නිදහසින් පසු යුගය දක්වා පැහැදිලි කරන්න.

************************************